06
පාඩම
षष्ठः पाठः।

# चिन्ता मास्तु।

## ප්‍රේරණාර්ථ ලෝට් (පරස්මෛපද)

ආශිර්වාද හා විධාන අර්ථ (ප්‍රේරණාර්ථ) සඳහා මෙය යෙදේ. ආශිර්වාදාර්ථය සඳහා පුරුෂත්‍රය ම යෙදෙන අතර විධානාර්ථයේ දී මධ්‍යම පුරුෂයේ යෙදේ. මෙය වර්තමානයට සමීප අනාගතයට අයත් වේ.

### ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

| | एक | द्वि | बहु | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|---|
| प्रथम | तु , तात् | ताम् | अन्तु | पठतु, पठतात् | पठताम् | पठन्तु |
| मध्यम | -[ हि], तात् | तम् | त | पठ, पठतात् | पठतम् | पठत |
| उत्तम | आनि | आव | आम | पठानि | पठाव | पठाम |

### එහි සිංහල අර්ථය

| පුරුෂ | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| ප්‍රථමපුරුෂ | පාඩම් කරාවා | (දෙදෙන) පාඩම් කරත්වා | පාඩම් කරත්වා |
| මධ්‍යමපුරුෂ | පාඩම් කරව/ පාඩම් කරහිවා | (දෙදෙන) පාඩම් කරව්/ (දෙදෙන) පාඩම් කරහුවා | පාඩම් කරව් / පාඩම් කරහුවා |
| උත්තමපුරුෂ | පාඩම් කරම්වා | (දෙදෙන) පාඩම් කරමෝවා | පාඩම් කරමෝවා |

ප්‍රේරණාර්ථ ලෝට් (ආත්මනේපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

| | एक | द्वि | बहु | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|---|
| प्रथम | ताम् | इताम् | अन्ताम् | पचताम् | पचेताम् | पचन्ताम् |
| मध्यम | स्व | इथाम् | ध्वम् | पचस्व | पचेथाम् | पचध्वम् |
| उत्तम | ऐ | आवहै | आमहै | पचै | पचावहै | पचामहै |

ලෝට් ලකාර ක්‍රියාපද ප්‍රේරණාර්ථයෙහි යෙදෙන ආකාරය වාක්‍යය මගින් හඳුනා ගනිමු.

१. पिता इच्छति।
- १. पुत्रः पठतु। (පුතා පාඩම් කරාවා !)
- २. चिकित्सकः भवतु। (වෛද්‍යවරයෙකු වේවා !)
- ३. देशसेवां करोतु। (රටට සේවයක් කරවා !)

२. यतिः वदति।
- १. सर्वे जनाः सुखिनः भवन्तु। (සියලු ජනයෝ සැප ඇත්තෝ වෙත්වා !)
- २. सर्वेभ्यः कल्याणं भवतु। (සියලු දෙනාට යහපතක් වෙත්වා !)

३. शिक्षकाः वदन्ति।
- १. सर्वे छात्राः सावधानं तिष्ठन्तु। (සියලු ශිෂ්‍යයෝ සිත් එකඟකරගෙන සිටිත්වා !)
- २. पाठं पठन्तु। (පාඩම් හදාරත්වා !)
- ३. लेखं लिखन्तु। (ලේඛන ලියත්වා !)
- ४. कोलाहलं न कुर्वन्तु। (කෝලාහල නොකරත්වා !)

४. पिता पुत्रं वदति।
- १. त्वं धर्मपाठशालां गच्छ। (ඔබ දහම් පාසලට යන්න.)
- २. सत्यं वद। धर्मं चर। (සත්‍යය කියන්න. ධර්මයෙහි හැසිරෙන්න.)

५. शिक्षकः छात्रं वदति।
- १. त्वम् उत्तिष्ठ। (ඔබ නැගිටින්න.)
- २. त्वम् उपविश। (ඔබ ඉඳගන්න.)
- ३. त्वं बहिः गच्छ। (ඔබ පිටතට යන්න.)

६. शिक्षकः छात्रान् वदति । → १. यूयं पाठं पठत । (නුඹලා පාඩම් හදාරව්.)
→ २. यूयं वाक्यं लिखत । (නුඹලා වාක්‍යය ලියව්.)
→ ३. यूयं चित्रं पश्यत । (නුඹලා චිත්‍රය බලව්.)

७. सैनिकः वदति । एतत् मम कर्तव्यम् । - (මෙය මම කළ යුතු ය.
→ १. अहं देशं रक्षाणि । (මම රට රකිම්වා!)

८. छात्रः वदति । → १. श्वः परीक्षा अस्ति । (හෙට විභාගයක් ඇත.)
→ २. अद्य अहं पठानि । (අද මම පාඩම්කරම්වා !)

९. शिक्षकाः वदन्ति । → १. वयं समये विद्यालयं गच्छाम । (අපි වේලාවට පාසලට යමුමෝවා !)
→ २. वयं प्रतिदिनं प्रार्थना करवाम । (අපි දිනපතා ප්‍රාර්ථනා කරමෝවා !)
→ ३. वयं दुर्गुणान् न भजाम । (අපි දුදනන් ඇසුරු නොකරමෝවා !)

१०. छात्राः वदन्ति । → १. इदानीं वयं गृहं गच्छाम । (දැන් අපි ගෙදර යමුමෝවා !)

## අභ්‍යාසය 01

01. වරහන් තුළ ඇති ලෝට් ලකාර පරස්මෛපද ක්‍රියාරූපවලින් වාක්‍ය සම්පූර්ණ කරන්න.

| | | |
|---|---|---|
| १. गजः वनं | ............... । | [ गच्छतु / गच्छति / अगच्छत् ] |
| २. गायकः गीतं | ............... । | [ गायति / गायतु / अगायत् ] |
| ३. माता भोजनं | ............... । | [ पचति / पचतु / अपचत् ] |
| ४. सेवकौ सेवां | ............... । | [ कुरुताम् / कुरुतः / अकुरुताम् ] |
| ५. सर्वे जनाः सुखिनः | ............... । | [ भवीन्त / भवन्तु / अभवन् ] |
| ६. वैद्यः ओषधं | ............... । | [ यच्छति / अयच्छत् / यच्छतु ] |
| ७. सर्वे छात्राः सावधानं | ............... । | [ तिष्ठन्ति / तिष्ठन्तु / अतिष्ठन् ] |

| | | |
|---|---|---|
| ८. कोलाहलं मा | ............... । | [ कुरु / करोषि / अकरोः ] |
| ९. छात्रः प्रश्नं | ............... । | [ पृच्छति / पृच्छतु / अपृच्छत् ] |
| १०. त्वं क्षीरं | ............... । | [ पिब / पिबसि / अपिबः ] |
| ११. त्वं धर्मं | ............... । | [ चरसि / चर / अचरः ] |
| १२. युवां फलं | ............... । | [ खादथः / खादतम् / अखादतम् ] |
| १३. यूयं जलं | ............... । | [ रक्षत / रक्षथः / अरक्षत ] |
| १४. यूयं चित्रं | ............... । | [ पश्यत / पश्यथः / अपश्यत ] |
| १५. यूयम् उत्तरं | ............... । | [ वदथः / वदत / अवदत ] |
| १६. अहं देशं | ............... । | [ रक्षाणि / रक्षामि / अरक्षम् ] |
| १७. अहं शीघ्रं | ............... । | [ चलामि / चलाणि / अचलम् ] |
| १८. आवां संस्कृतं | ............... । | [ पठाव / पठावः / अपठाव ] |
| २९. अहं वस्त्राणि | ............... । | [ प्रक्षालयाणि / प्रक्षालयामि / प्रक्षालयम् ] |
| २०. वयं विद्यालयं | ............... । | [ गच्छाम / गच्छामः / अगच्छाम ] |

## ක්‍රියාකාරකම 01

01. ඉහතින් දැක්වුණු සියලු ම වාක්‍යයන් වර්තමාන කාලයට හා අතීත කාලයට හරවන්න.

නිදසුන:- වර්තමාන **गजः वनं गच्छति ।**
(ඇතා වනයට යයි.)

අතීත **गजः वनम् अगच्छत् ।**
(ඇතා වනයට ගියේ ය.)

## අභ්‍යාසය 02

01. **गम्** ධාතුව හා **वद्** ධාතුව ලෝට් ලකාර පරස්මෛපදයෙහි වරනගන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | गच्छतु | | | | वदतु | | |
| मध्यमपुरुष | | | | | | | |
| उत्तमपुरुष | | | | | | | |

## අභ්‍යාසය 03

01. හිස්තැන් පුරවන්න.

| पुरुष वचन | लट् | लङ् | लोट् |
|---|---|---|---|
| प्र. पुरुष - एक | करोति | | |
| म. पुरुष - एक | खादसि | अखादः | |
| उ. पुरुष - एक | | | पिबानि |
| म. पुरुष - बहु | | | लिखत |
| प्र. पुरुष - बहु | | अपश्यन् | |
| उ. पुरुष - द्वि | धावावः | | |
| प्र. पुरुष - द्वि | | अवदताम् | |
| उ. पुरुष - बहु | | | वसाम |

## අභ්‍යාසය 04

01. **लभ्** ධාතුව හා **सेव्** ධාතුව ලෝට් ලකාර ආත්මනේපදයෙහි වරනගන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | लभताम् | | लभन्ताम् | | सेवताम् | | |
| मध्यमपुरुष | | लभेथाम् | | | | | सेवध्वम् |
| उत्तमपुरुष | लभै | | | | | सेवावहै | |

## අභ්‍යාසය 05

01. ලෝට් ලකාර ආත්මනේපද ක්‍රියා රූපවලින් වාක්‍ය සම්පූර්ණ කරන්න.

१. जननी पुत्रं ............... । जन् (මව පුතකු බිහිකරාවා)
२. ते संस्कृतं ............... । भाष् (ඔවුහු සංස්කෘත කියත්වා)
३. त्वं बुद्धं ............... । वन्द् (ඔබ බුදුන් වඳිහිවා)
४. त्वं मा ............... । क्षम् (ඔබ මා රකිහිවා)
५. यूयं सत्यं ............... । भाष् (ඔබලා සත්‍යය කියහුවා)
६. अहं सत्यं ............... । भाष् (මම සත්‍යය කියම්වා)
७. वयं देशं ............... । सेव् (අපි දේශය ඇසුරු කරමෝවා)
८. छात्रौ बुद्धं ............... । सेव् (ශිෂ්‍යයෝ දෙදෙනා බුදුන් ඇසුරු කරත්වා)
९. पण्डिताः सम्मानं ............... । लभ् (පණ්ඩිතයෝ සම්මානය ලබත්වා)
१०. वयं सर्वदा संस्कृतं ............... । भाष् (අපි සැමදා සංස්කෘත කථාකරමෝවා)

## විධිසම්භාවනාර්ථ විධිලිඞ් (පරස්මෛපද)

විධානය හා සම්භාවනා යන අරුත් සඳහා මෙය යෙදේ. විධි යනු විධානය යි. සම්භාවනා යනු වෙතොත් මැනවි, විය හැකියි යන අරුත් ප්‍රකාශ වීමයි. වර්තමානයට සමීප අනාගතකාලයට මෙය අයත් වේ.

### ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

| | एक | द्वि | बहु | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|---|
| प्रथम | ईत् | ईताम् | ईयुः | भवेत् | भवेताम् | भवेयुः |
| मध्यम | ईः | ईतम् | ईत | भवेः | भवेतम् | भवेत |
| उत्तम | ईयम् | ईव | ईम | भवेयम् | भवेव | भवेम |

### එහි සිංහල අර්ථය

| පුරුෂ | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| ප්‍රථමපුරුෂ | වන්නේ නම් මැනවි | (දෙදෙන) වන්නාහ නම් මැනවි | වන්නාහ නම් මැනවි |
| මධ්‍යමපුරුෂ | වන්නෙහි නම් මැනවි | (දෙදෙන) වන්නෙහු නම් මැනවි | වන්නෙහු නම් මැනවි |
| උත්තමපුරුෂ | වන්නෙමි නම් මැනවි | (දෙදෙන) වන්නෙමු නම් මැනවි | වන්නෙමු නම් මැනවි |

## විධිසම්භාවනාර්ථ විධිලඞ් (ආත්මනේපද)

### ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

| | एक | द्वि | बहु | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|---|
| प्रथम | ईत | ईयाताम् | इरन् | पचेत | पचेयाताम् | पचेरन् |
| मध्यम | ईथाः | ईयाथाम् | ईध्वम् | पचेथाः | पचेयाथाम् | पचेध्वम् |
| उत्तम | ईय | ईवहि | ईमहि | पचेय | पचेवहि | पचेमहि |

එක ම වාක්‍යය ලට්, ලෘට්, ලඞ්, ලෝට්, ලඞ් යන ලකාරයන්හි යෙදෙන ආකාරය හඳුනා ගනිමු.

लट् - बालकः पुस्तकं पठति।  (ළමයා පොත හදාරයි.)

लृट् - बालकः पुस्तकं पठिष्यति।  (ළමයා පොත හදාරන්නේ ය.)

लङ् - बालकः पुस्तकम् अपठत्  (ළමයා පොත හැදෑරුවේ ය.)

लोट् - बालकः पुस्तकं पठतु।  (ළමයා පොත හදාරාවා)

लिङ् - बालकः पुस्तकं पठेत्।  (ළමයා පොත හදාරන්නේ නම් මැනවි.)

## ක්‍රියාකාරකම 02

01. පහත දක්වා ඇති ලට් ලකාර වාක්‍යය ඉදිරිපත් කළ විට ලෝට් සහ විධිලිඞ් වාක්‍ය මතකයෙන් කීමට පුරුදු වන්න.

| लट् | लोट् | लिङ्ङ् |
|---|---|---|
| १. माता भक्तं पचति। (මව බත් පිසයි) | १. माता भक्तं पचतु। (මව බත් පිසාවා) | १. माता भक्तं पचेत्। (මව බත් පිසන්නේ නම් මැනවි) |
| २. सेवकः वस्त्राणि क्षालयति। (සේවකයා වස්ත්‍ර සෝදයි) | २. सेवकः वस्त्राणि क्षालयतु। (සේවකයා වස්ත්‍ර සෝදාවා) | २. सेवकः वस्त्राणि क्षालयेत्। (සේවකයා වස්ත්‍ර සොදන්නේ නම් මැනවි) |
| ६. सा विद्यालयं गच्छति। (ඈ විදුහලට යයි) | ६. सा विद्यालयं गच्छतु। (ඈ විදුහලට යේවා) | ६. सा विद्यालयं गच्छेत्। (ඈ විදුහලට යන්නේ නම් මැනවි) |
| ४. बालकः गृहं गच्छति। (ළමයා ගෙදර යයි) | ७. बालकः गृहं गच्छतु। (ළමයා ගෙදර යේවා) | ७. बालकः गृहं गच्छेत्। (ළමයා ගෙදර යන්නේ නම් මැනවි) |
| ५. दारकाः फलानि खादन्ति। (දරුවෝ ගෙඩි කති) | ४. दारकाः फलानि खादन्तु। (දරුවෝ ගෙඩි කත්වා) | ४. दारकाः फलानि खादेयुः। (දරුවෝ ගෙඩි කන්නාහ නම් මැනවි) |

| | | |
|---|---|---|
| ६. बालिकाः गीतं गायन्ति।<br>(බාලිකාවෝ ගීයක් ගයත්) | ५. बालिकाः गीतं गायन्तु।<br>(බාලිකාවෝ ගීයක් ගයාවා) | ५. बालिकाः गीतं गायेयुः।<br>(බාලිකාවෝ ගීයක් ගායනා කරන්නාහු නම් මැනවි.) |
| ७. सैनिकाः देशं रक्षन्ति।<br>(සෙබළු රට රකිති) | ६. सैनिकाः देशं रक्षन्तु।<br>(සෙබළු රට රකිත්වා) | ६. सैनिकाः देशं रक्षेयुः।<br>(සෙබළු රට රකින්නාහු නම් මැනවි.) |
| ८. त्वं गुरुं नमसि।<br>(ඔබ ගුරුවරයා නමදිහි) | ८. त्वं गुरुं नम।<br>(ඔබ ගුරුවරයා නමදින්න) | ८. त्वं गुरुं नमेः।<br>(ඔබ ගුරුවරයා නමදින්නෙහි නම් මැනවි.) |
| ९. यूयं चित्रं पश्यथ।<br>(නුඹලා චිත්‍රය බලහු) | ९. यूयं चित्रं पश्यत।<br>(නුඹලා චිත්‍රය බලව්) | ९. यूयं चित्रं पश्येत।<br>(නුඹලා චිත්‍රය බලන්නාහු නම් මැනවි.) |
| १०. वयं दुग्धं पिबामः।<br>(අපි කිරි බොමු) | १०. वयं दुग्धं पिबाम।<br>(අපි කිරි බොමුමෝවා) | १०. वयं दुग्धं पिबेम।<br>(අපි කිරි බොන්නෙමු නම් මැනවි.) |

## අභ්‍යාසය 06

01. විධිලිඞ් ලකාර පරස්මෛපද ක්‍රියාරූපවලින් වාක්‍ය සම්පූර්ණ කරන්න.

१. अहं पुस्तकं ............... । पठ् ( මම පොත හදාරන්නෙමි නම් මැනවි.)

२. बालिका नगरं ............... । गम् ( බාලිකාව නගරයට යන්නී නම් මැනවි.)

३. छात्राः उद्याने ............... । क्रीड् (ශිෂ්‍යයෝ උයනෙහි ක්‍රීඩා කරන්නෙහු නම් මැනවි.)

४. अहं संस्कृतभाषायां कोविदः ............... । भू ( මම සංස්කෘත භාෂාවෙහි දක්ෂයෙක් වන්නෙමි නම් මැනවි.)

५. बालकः गीतं ............... । गै ( ළමයා ගීයක් ගායනා කරන්නේ නම් මැනවි.)

६. त्वं साधुः............... । भू ( ඔබ සත්පුරුෂයෙක් වන්නෙහි නම් මැනවි.)

७. आवां गृहे ............... । वस् ( අපි දෙදෙනා ගෙදර වාසය කරන්නෙමු නම් මැනවි.)

९. वयं याचकाय अन्नं ............... । दा ( අපි යාචකයාට කෑම දෙන්නෙමු නම් මැනවි.)

१०. चोरः सत्यं ............... । वद् ( සොරා සත්‍යය කියන්නේ නම් මැනවි.)

## අභ්‍යාසය 07

01. හිස්තැන් පුරවන්න.

| पुरुष वचन | लट् | लङ् | लोट् |
|---|---|---|---|
| प्र. पुरुष - एक | करोति | | कृर्यात् |
| म. पुरुष - एक | तिष्ठसि | | |
| उ. पुरुष - एक | | | पिबेयम् |
| म. पुरुष - बहु | लिखथः | | लिखेत |
| प्र. पुरुष - बहु | | लिखन्तु | |
| उ.पुरुष - द्वि | धावावः | | |
| प्र. पुरुष - द्वि | | | वसेताम् |
| उ. पुरुष - बहु | | वसाम | |

## सदैव पुरतो निधेहि चरणम् ।

चल चल पुरतो निधेहि चरणम्।
सदैव पुरतो निधेहि चरणम्॥

गिरिशिखरे ननु निजनिकेतनम्।
विनैव यानं नगारोहणम्।
बलं स्वकीयं भवति साधनम्।
सदैव पुरतो ............... ॥
पथि पाषाणा विषमाः प्रखराः।
हिंस्राः पशवः परितो घोराः॥
सुदुष्करं खलु यद्यपि गमनम्।
सदैव पुरतो ................ ॥
जहीहि भीतिं भज भज शक्तिम्।
विधेहि राष्ट्रे तथाऽनुरक्तिम्॥
कुरु कुरु सततं ध्येय-स्मरणम्।
सदैव पुरतो ................. ॥

रचकः- श्रीधरभास्कर वर्णकरः

**පෙරට ම යන්න දිරිය ගන්න**

යනු මැන යනු මැන පෙර මග බලමින්
පෙරට ම යනු සැමදා පා තබමින්

ඔබෙ නිවහන කඳු මුදුනේ යහතින්
එහි යාමට යානා නොම සොයමින්
ඔබේ දෙපා වාරුව ගැන සිතමින්
යනු මැන යනු මැන පෙර මග බලමින්..//

නැත යන මග පාවඩ බුමුතුරුණු
ඇත උල් කටු වන සිවු පා දරුණු
දුෂ්කර බව කීමට ඇත කරුණු
යනු මැන යනු මැන පෙර මග බලමින්..//

බිය දුරු කර සිත දිරිය වඩන්න
සැමවිට දි ම රට දැය සුරකින්න
කළයුතු දේ නිති ඉටු කරලන්න
යනු මැන යනු මැන පෙර මග බලමින්..//
පෙරට ම යනු සැමදා පා තබමින්..//

අන්තර්ජාලයට පිවිස මේ ගීතය ශ්‍රවණය කළ හැකි ය.

web:- 8th-4_1 NCERT Ruchira 8th Bhaag-3

## අභ්‍යාසය 08

01. ඉහත ගීතයෙහි ඇති පහත සඳහන් ලෝට් ලකාර ක්‍රියාපදයන්හි පුරුෂ, වචන හා තේරුම ලියන්න.

चल    धेहि    देहि    भज    कुरु

**गतं न शोचामि कृतं न मन्ये ।**
**ගතං න ශෝචාමි කෘතං න මන්‍යෙ**
**ගිය දේ ගැන ශෝක නො කරමි. කළ දේ ගැන නො සිතමි.**

**चक्रवत्परिवर्तन्ते दुःखानि च सुखानि च ।**
**චක්‍රවත්පරිවර්තන්තේ දුඃඛානි ච සුඛානි ච**
**සැප දුක් දෙක චක්‍රයක් මෙන් කැරකේ.**

**चिन्तासमं नास्ति शरीरशोषणम् ।**
**චින්තාසමං නාස්ති ශරීරශෝෂණම්**
**සිතිවිලි හා සමාන සිරුර වියළවන දෙයක් නැත.**